# පුරප්පාඩු

## ශ්‍රී පාලි මණ්ඩපය - කොළඹ විශ්වවිද්‍යාලය

ශ්‍රී පාලි මණ්ඩපයෙහි පුරප්පාඩුව පවතින පහත තනතුර සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික අයදුම්කරුවන්ගෙන්
2026 ජුනි මස 09 වැනි දින දක්වා අයදුම්පත් භාර ගනු ලැබේ.

01. <u>බංගලා භාරකරු හා අරක්කැමි (III ශ්‍රේණිය)</u>

සුදුසුකම් :

1. අ.පො.ස.(සා.පෙළ) විභාගය සඳහා අවම වශයෙන් සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) සමත්වී තිබීම සහ <u>තනතුරට අදාලව</u> තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ Level) 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම. (පාඨමාලාවට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම (NVQ Level) තහවුරු කිරීම සඳහා තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් නිකුත් කරන ලද සමානතා සහතිකයක් (Certificate of Equivalence) ඉදිරිපත් කල යුතුය.

හෝ

2. අවම වශයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව විෂයයන් හයකින් (06) අ.පො.ස.(සා.පෙළ) විභාගය සමත්වී තිබීම සහ කාර්මික කුසලතා සහිත අදාල ක්ෂේත්‍රයේ වසරක (01) සේවා පලපුරුද්දක් ලබා තිබීම.

වයස : අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

වැටුප් පරිමාණය : U – PL 2(III ) - රු.44,575–16x490- 52,415/- මාසික

බඳවා ගැනීමේ ක්‍රමය : වෘත්තීය පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින්

<u>කොන්දේසි සහ ප්‍රතිලාභ:</u>

01. ඉහත තනතුර සඳහා වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව සහ ඊට අමතරව විශ්වවිද්‍යාල පද්ධතියට අදාළ රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ .
02. තෝරාගත් අපේක්ෂකයා විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සහ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සාමාජිකයෙකු වනු ඇත. ඔහු /ඇය ගේ මාසික වැටුපෙන් 10% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට දායක වන අතර ඒ සමඟම,සේවා යෝජකයා විසින් සේවකයාගේ වැටුපෙන් 15% කට සමාන මුළු දායකත්වයක් ලබා දෙනු ඇත. (එයින් 8% ක් විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලට සහ 7% ක් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට බැර කෙරේ).
03. 1980 අංක 46 දරණ සේවක භාර අරමුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව විශ්වවිද්‍යාලය විසින් වැටුපෙන් 3% ක් සේවක භාර අරමුදලට දායක කරනු ලැබේ.
04. බඳවා ගැනීමට අදාල අනෙකුත් කොන්දේසි 16/1978 දරණ විශ්වවිද්‍යාල පනත හා එහි අනෙකුත් සංශෝධන, නියමාවලි, නීති හා රෙගුලාසි වලට අනුකූල වේ.

අයදුම්පත් එවිය යුතු ආකාරය

1. ඉහත තනතුරු සඳහා අයදුම් කිරීමට අපේක්ෂා කරන අයදුම්කරුවන්ට ශ්‍රී පාලි මණ්ඩපයේ වෙබ් අඩවියෙන් (https://spc.cmb.ac.lk) ආදර්ශ අයදුම්පත බාගත (Download) කර ගත යුතුය.

2. සම්පූර්ණ කරන ලද අයදුම්පත, සත්‍ය පිටපත් බවට සනාථ කරන ලද අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම් වලට අදාල සහතික පිටපත් සමග ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, ශ්‍රී පාලි මණ්ඩපය, කොළඹ විශ්වවිද්‍යාලය, වැවල, හොරණ යන ලිපිනයට 2026 ජුනි 09 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

3. අයදුම්පත බහා එවනු ලබන ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

4. අසම්පූර්ණ, අපැහැදිලි, අදාල සනාථ කිරීම් සිදු නොකළ, සහතික වල පිටපත් අමුණා නොමැති හෝ ප්‍රමාද වී එවනු ලබන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර එවැනි අයදුම්පත් කිසිදු හේතුවක් මත යළි සලකා බලනු නොලැබේ.

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, ශ්‍රී පාලි මණ්ඩපය, වැවල,හොරණ.
ලේඛකාධිකාරී කොළඹ විශ්වවිද්‍යාලය වෙනුවට
26.05.2026